OL/2009/15-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

ක්‍රිස්තියානි ධර්මය I,II
கிறிஸ்தவம் I,II
Christianity I,II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## ක්‍රිස්තියානි ධර්මය I

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.
(v) I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

1. සමාජ පරිහානිය ඉදිරියේ ස්නාවක ජොහන් වෙතින් පන්නරය ලබන බව පෙන්වීම සඳහා
   (1) සමාජය පිළිබඳ අනාවැකි පැවසිය යුතු ය.
   (2) සමාජ විරවරයකුගේ චරිතයක් රඟ දැක්විය යුතු ය.
   (3) සමාජ පරිවර්තනයන් සඳහා කටයුතු කළ යුතු ය.
   (4) සමාජ ප්‍රභූන් දැඩි විවේචනයට ලක් කළ යුතු ය.

2. මරිය තුමිය හා එලිසබෙත් යන ද්විත්ව චරිතයන් ගෙන් ආභාශය ලබන ඔබ
   (1) පූර්ණ දේව විශ්වාසයෙන් හා එඩිතර බවින් යුක්ත විය යුතු ය.
   (2) සමාජ තහංචි සියල්ල ප්‍රතික්ෂේප කළ යුතු ය.
   (3) අසන්නට ලැබෙන සැම පුවතකටම ප්‍රතිචාර දැක්විය යුතු ය.
   (4) දේව කැමැත්ත සිදුවන තෙක් ක්‍රියාකාරී නො විය යුතු ය.

3. නත්තල් නාට්‍යයක් සඳහා අර්ථාන්විත තේමා විය හැක්කේ
   A - නත්තල එක් දිනකට සීමා නො වේ.
   B - පෙරදිග රජවරුන් තිදෙනා බිළිඳුන් නමදියි.
   C - නත්තල කුඩා දරුවන් සඳහා ම වේ.
   D - අප හදවත් ජේසුට වාසස්ථාන කළ යුතු ය.
   මින් වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ
   (1) A, B (2) B, C (3) C, D (4) A, D

4. කිතුනු ජීවිතයේ පෙරළියක් සඳහා එද සාකෙවුස්ගේ ආදර්ශය ගත් විට වඩාත් යෝග්‍ය ක්‍රියා මාර්ගය වන්නේ
   (1) සන්තක දෙයින් අඩක් දිළිඳුන්ට දීම ය. (2) උපයන දෙයින් 1/10 පූජා කිරීම ය.
   (3) අන්‍යන් රවටනු නොලැබීම ය. (4) දේව ප්‍රේමය අළුතින් අත් දැකීම ය.

5. නැතිවූ පුත්‍රයාගේ කථාව ඇසුරෙන් ඔබ විශේෂයෙන් අවධාරණය කළ යුතු වන්නේ
   (1) අසීමිත ප්‍රේමය හා ත්‍යාගශීලිත්වය අන්‍යයන්ට අත්දකීමට සැලැස්වීමයි.
   (2) සිහි කල්පනාවෙන් යුතුව වැඩ කිරීමේ අවශ්‍යතාවයයි.
   (3) තමාගේ නිදහස රිසි අයුරින් යොදා ගැනීමයි.
   (4) නොමග ගිය අය පිළිබඳ ක්‍රියා පිළිවෙත් සිතා බැලීමයි.

[ දෙවැනි පිටුව බලන්න.

6. "උන්වහන්සේ උත්ථානවූ සේක." මේ සුපුවත ප්‍රකාශ කරන කිතුනුවා
   (1) ක්‍රිස්තු උත්ථානය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නෙකු විය යුතු ය.
   (2) ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය බලා සිටින්නකු විය යුතු ය.
   (3) සමස්ත සමාජයේ ම පෙරළියක් අපේක්ෂාවෙන් ක්‍රියා කරන්නකු විය යුතු ය.
   (4) කුරුසියේ සේවායකු විය යුතු ය.

7. ඔබ ලැබූ කිතුනු බව්තිස්මය අර්ථවත් වන්නේ
   (1) දහම් පාසලේ ක්‍රියාකාරී දරුවකු වීමෙන් පමණකි.
   (2) නව ජීවිත මගකට යොමු වීමට අදිටන් කිරීමෙන් පමණකි.
   (3) ශුද්ධාත්ම බලයෙන් දිවි ගෙවීමෙන් පමණකි.
   (4) මනස්ථාපනයේ ජීවිතයක් ගත කිරීමෙන් පමණකි.

8. දෙව් මැඳුරේ රැඳී සිටි ජේසු තුමා වෙතින් ආදර්ශය ලබන අප
   (1) තර්ක කිරීමෙන් ගුරුවරුන් අපහසුවට ලක් කළ යුතු ය.
   (2) උත්සව කටයුතු නිම වුවද දෙව් මැඳුරේ රැඳී සිටිය යුතු ය.
   (3) කිතුනු වගකීම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතු ය.
   (4) දේව සේවයට මුල් තැන දීමට සිතට ගත යුතු ය.

9. (I) කොටසෙහි ඇති ප්‍රකාශයට (II) කොටසේ නිවැරදි වාක්‍යාංශය වන්නේ

| (I) | (II) |
|---|---|
| ධර්මදූත සේවය අපේක්ෂිත ඵල නොදැරීමට හේතු වන්නේ | A - දෙවිඳුන්ට හිමි ගෞරවය තමන් ගැනීම ය.<br>B - බැටළුවන් ලෙස ක්‍රියා නොකිරීම ය.<br>C - සංනිවේදන මාර්ග මඳ වීම ය.<br>D - ලෞකිකත්වය ඉස්මතු වීම ය. |

   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

10. 'ඔබ දෙවියන්වහන්සේ ගේ ක්‍රිස්තුවරයාණෝය' යන පේදුරුගේ ප්‍රකාශය අනුව අප විශ්වාසය තබන්නේ
   (1) අප ඉල්ලන සියල්ල ක්ෂණිකව ලබා දෙන දෙවිඳුණන් කෙරෙහි ය.
   (2) අපගේ විරුද්ධ කරුවන්ට දඬුවම් දෙන දෙවිඳුණන් කෙරෙහි ය.
   (3) ප්‍රතිහාර්ය මගින් පමණක් අප ළහට එන දෙවිඳුණන් කෙරෙහි ය.
   (4) නිරතුරුව අප උසුලන දෙවිඳුණන් කෙරෙහි ය.

11. ජේසුස් වහන්සේ විනය ධරයින්ගේ ක්‍රියා කලාපය අනුමත නොකළ සේක. ඒ අනුව වඩාත් නිවැරදි ක්‍රියා කලාපයන් වන්නේ
   (1) ප්‍රචාරයට මුල් තැන දෙමින් කිහිප දෙනෙකුට ආහාර බෙදීමයි.
   (2) නීති පිළිපැදීමට වඩා දිළිඳුන් නගා ලීමට ප්‍රමුඛත්වය දීමයි.
   (3) පැරණි ස්මාරක කඩා බිඳ දැමීමයි.
   (4) උත්සව අවස්ථාවන්හි දී කැපී පෙනෙන ලෙස කටයුතු කිරීමයි.

12.

| ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂාවන් | | |
|---|---|---|
| පරීක්ෂාව | වර්තමාන තත්ත්වය | මෙම පරීක්ෂා ඉදිරියේ කිතුනු ප්‍රතිචාරය |
| නපුරට නමස්කාර කිරීම | ධනයට, බලයට කීර්තියට නමස්කාර කිරීම | A - ධනය, බලය ගැන නොසිතා දිළිඳු ලෙස ජීවත් වීම<br>B - දෙවිඳුන්ට පූර්ණ අවනත භාවයෙන් පරීක්ෂා ජය ගැනීම<br>C - පරීක්ෂාවට මුහුණ පෑම දේව කැමැත්ත බව සිතීම<br>D - ධනය, බලය තුළින් ම පරිකෂා ජය ගැනීම |

ඉහත වගුව අනුව වඩාත් නිවැරදි කිතුනු ප්‍රතිචාරය වන්නේ
   (1) A (2) B (3) C (4) D

13. වර්තමාන කිතුනු සභාව මුහුණ පාන අභියෝග ජය ගැනීමට මුල් කිතුනු සභාවෙන් ලැබෙන මග පෙන්වීම වන්නේ
   (1) ගරු කටයුතු අයට ගරු කිරීමට සැළැස්වීමයි.
   (2) දයයෙන් කොටස පිදීමෙන් සභාවේ මූල්‍යමය හැකියාව තර කිරීමයි.
   (3) බහිෂ්කාර වාදයෙන් අඩංගුතා වාදයට පිවිසීමයි.
   (4) යාච්ඤාවේ බලය පදනම් කරගෙන ක්‍රියාකාරී වීමයි.

14. එදා ජේසුස් වහන්සේ ජෙරුසලම පිළිබඳ ශෝක වූ සේක. අද උන්වහන්සේ ශ්‍රී ලංකාව පිළිබඳව සතුටු වීමට නම් අප
    (1) අපට විරුද්ධය යයි සිතෙන අය කොන් කළ යුතු ය.
    (2) සමාජයේ අවැඩ විවේචනය කිරීමෙන් වැළකිය යුතු ය.
    (3) සාධාරණ සමාජයක් සඳහා ඇප කැප විය යුතු ය.
    (4) ආර්ථික සංවර්ධනයට සැලසුම් ඉදිරිපත් කළ යුතු ය.

15. පහත දක්වෙන්නේ නත්තල් සමයේ වූ සිදුවීම් කිහිපයකි.
    A - විවිධ විලාසිතා සහිත ඇඳුමින් සාජ්ජු පිරි යාම
    B - මත් පැන් අලෙවි සැල් ජනයාගෙන් පිරී යාම
    C - අධි සුඛෝපභෝගී ප්‍රිය සම්භාෂණ පැවැත්වීම
    D - බැති ගී හඬින් දෙවු මැදුරු පිරියාම
    ධනවතා හා ලාසරුස් පිළිබඳ කතාවට නව අර්ථ කථනයක් සැපයීමට අප වෙනස් කළ යුත්තේ
    (1) A, B (2) B, C (3) C, D (4) A, D

16. කිතුනු දරුවකු වන ඔබ දුක් වේදනා හා ගැටළු මධ්‍යයෙහිදී
    (1) සහනය ලැබේ යැයි පැවසෙන ස්ථානයන්ට ගොස් භාර විය යුතු ය.
    (2) ජීවිතයෙන් පලා යන මාර්ග අනුගමනය කළ යුතු ය.
    (3) දුක් වේදනා මැද නිර්භීතව ජීවිතයට මුහුණ දිය යුතු ය.
    (4) මිනිසුන්ට දුක උරුම බව සිතා සැනසිය යුතු ය.

17. "පිටස්තර පුද්ගලයකු ලවා තම දරුවා මරා දමූ මවක් සිරභාරයට" - ප්‍රවෘත්තියක්. මෙවැනි පුවත් අසන්නට ලැබෙන්නේ
    (1) පරිත්‍යාගශීලී ප්‍රේමය ගිලිහී ගොස් ඇති නිසා ය.
    (2) සමාජ රැල්ලට හසුවීම නිසා ය.
    (3) දෙමව්පියන්ගේ නොසැලකිල්ල නිසා ය.
    (4) මිනිසා වඩ වඩා දමරික වන නිසා ය.

18. පාවුල් පිලිප්පියේ දී මුහුණ දුන් අභියෝග ඇසුරෙන් ඔබ පිළිගත යුත්තේ
    (1) යහපත තෝරා ගැනීමේ දී අයහපත ප්‍රතික්ෂේප කිරීම අනිවාර්ය බවයි.
    (2) යහපත හා අයහපත තෝරා බේරා ගැනීම අපහසු බවයි.
    (3) සමාජයේ අයහපත නොදුටුවාක් මෙන් සිටිය යුතු බවයි.
    (4) බහුතරය තෝරා ගන්නා දේ යහපත් බවයි.

19. වර්තමාන ශ්‍රී ලාංකික කිතුනුවා සේවයේ දී කාලීන වශයෙන් ප්‍රමුඛතාවය දිය යුත්තේ
    (1) අවතැන්වී සිටින සහෝදර ජනතාවගේ ජීවිත නගා සිටුවාලීමට ය.
    (2) ඔවුන් වෙතට ශුද්ධ ලියවිලි කොටස් ගෙන යාමට ය.
    (3) විදි දරුවන්ගේ තලෙන්ත හඳුනා ගැනීමට ය.
    (4) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නිවාස ගොඩ නැගීමට ය.

20. පාවුල් තුමාගේ ආදර්ශය අනුව වර්තමාන කිතුනු මෙහෙවර
    (1) අන්‍යයන් අරබයා ක්‍රමානුකූලව සිදු කළ යුතු ය.
    (2) නිවැරදි දැක්මක් අනුව අවස්ථාවෝචිතව සිදු කළ යුතු ය.
    (3) ක්ෂණික ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ක්ෂණිකව සිදු කළ යුතු ය.
    (4) අරගල නිරාකරණය කරමින් සිදු කළ යුතු ය.

21. පාපයේ ජීවිතයෙන් අපට නව ජීවයක් කරා යොමුවීමට මෙසියස් වහන්සේගෙන් ලැබෙන ආලෝකය අනුව
    (1) දිවැසිවරුන් වෙත යොමුවිය යුතු ය. (2) පූර්ණ විමුක්තිය සෙවිය යුතු ය.
    (3) විමුක්ති අරගලයක යෙදිය යුතු ය. (4) පාප බැම් ලිහිල් කර ගත යුතු ය.

22. ජුදෙව් දිවැසිවරයකු ශ්‍රී ලංකාවට පැමිණිය හොත් ඉදිරිපත් කරතැයි සිතන ප්‍රධාන අගයයක් වන්නේ
    (1) මිනිසාගේ ජීවිතයත් ආගමත් එකට බැඳී පැවතිය යුතු බවයි.
    (2) ඉඩම් පරම්පරානුගතව පමණක් බෙදා ගත යුතු බවයි.
    (3) විස්තෘත පවුල් ක්‍රමය අනුමත කළ යුතු බවයි.
    (4) පුරුෂාධිපත්‍යය පිළිගත යුතු බවයි.

[ හතරවැනි පිටුව බලන්න.

23. ජේසුස් වහන්සේට මරණ තීන්දුව දුන් පිලාත්ට ප්‍රතිවිරුද්ධව කටයුතු කිරීමට නම් කිතුනුවා
   (1) යුක්තිය හා සාධාරණය නිර්වචනය කළ යුතු ය.
   (2) යුක්තිය හා සාධාරණත්වය ඉටු නොකිරීමට හේතු දක්විය යුතු ය.
   (3) යුක්තිය හා සාධාරණත්වය කඩවූ අවස්ථා අනාවරණය කළ යුතු ය.
   (4) යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීමේ දී තම වරප්‍රසාද නොතකා ක්‍රියා කළ යුතු ය.

24.

| කිතුනු පවුල් සංකල්පය | |
|---|---|
| ප්‍රශ්නය | හතර දෙනකුගේ පිළිතුරු |
| කිතුනු සහෝදරත්වය දක්වීමට ඔබ කුමක් කළෙහි ද? | A - සහෝදරයාට ප්‍රේම කරන බව පැවසුවෙමි.<br>B - අවතැන්වූවන්ගේ කඳවුරේ සිටි දෙදෙනකු නිවසට පිළිගත්තෙමි.<br>C - මගේ ම සහෝදරයාගේ දියුණුව පතා ක්‍රියා කළෙමි.<br>D - කිතුනු සහෝදරත්වය තේමා කරගත් වැඩ මුළුවකට සහභාගිවූවෙමි. |

කිතුනු ප්‍රේමය ක්‍රියාත්මක කොට ඇත්තේ
   (1) A (2) B (3) C (4) D

25. "සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන්වහන්සේ ගේ දේ දෙවියන්වහන්සේටත් දෙන්න." මේ අනුව වර්තමාන කිතුනුවාගේ විශේෂ වගකීම වන්නේ
   (1) රජයටත් ආගමික නායකයන්ටත් යටත්ව කටයුතු කිරීමයි.
   (2) රජයේ රැකියාවක යෙදෙමින් කිතුනු සභාවේ තිලයක් දැරීමයි.
   (3) රජයට හා සභාවට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ඉටුකිරීමයි.
   (4) පූජාවන් අතපසු වුවත් රජයට බදු ගෙවීමයි.

26.

| දුරිද්‍රතාවය මැද | |
|---|---|
| කිතුනු වගකීම | කිතුනු කාර්ය භාරය |
| දුරිද්‍රතාවය පිටු දැකීම | A - සම්පත් සමසේ බෙදී යන සමාජයක් ඇති කිරීමට පෙරමුණ ගැනීම<br>B - තමන් සතු සියලු වත්කම් දිළිඳුන්ට බෙද දීම<br>C - සාමකාමී වාතාවරණයක් තහවුරු කිරීම<br>D - ශ්‍රම සූරාකෑමට විරුද්ධව හඬ නැගීම |

ඉහත වගුව අනුව ප්‍රමුඛතාවය දිය යුත්තේ
   (1) A (2) B (3) C (4) D

27. ජේසුස් වහන්සේ නොහඳුනන බව පැවසූ පේදුරු හා සමාන නොවීමෙන් හභවන්නේ
   (1) මරණ තර්ජන නොතකා නිර්දෝෂී මිතුරා බේරා ගැනීමට ක්‍රියා කිරීමයි.
   (2) තමාට එල්ල වූ චෝදනා නිසා සිය මිතුරා අත්හැර දැමීමයි.
   (3) වරද කරුවකු වූ මිතුරා සමග සබඳතා නැවැත්වීමයි.
   (4) මිතුරාගෙන් නො ලැබෙන ප්‍රයෝජන ප්‍රභූවරුන්ගෙන් සෙවීමයි.

28. පරිසිවරයාගේ හා අයකැමියාගේ කථාවෙහි දක්වෙන අයකැමියාගේ ක්‍රියාකලාපයෙන් ඔබ චරිතායනය කළ යුත්තේ
   (1) දෙවිඳුන් අබිමුව තම සැබෑ අනන්‍යතාවය පිළිගැනීමේ චරිත ලක්ෂණයයි.
   (2) දෙවිඳුන් අබිමුව අනෙකුත් අය හා තමා සැසඳීමේ චරිත ලක්ෂණයයි.
   (3) දෙවිඳුන් අබිමුව අන්‍යන්ගේ ක්‍රියා කලාපය විවේචනය කිරීමේ චරිත ලක්ෂණයයි.
   (4) තම පෞරුෂත්වය ගොඩ නැගීමට අධිතක්සේරුවක යෙදීමේ චරිත ලක්ෂණයයි.

29.

| එදා පුරවැසිභාවය පාවුල් යොදගත්තේ ⟶ | අසාධාරණයට විරුද්ධව කටයුතු කිරීමේ ආයුධයක් ලෙස ය. |
|---|---|
| අද-පුරවැසිභාවය ශ්‍රී ලාංකික කිතුනුවන් යොද ගත යුත්තේ | A - ජීවිතයට ආභරණයක් ලෙසිනි.<br>B - අයිතිවාසිකම් සඳහා හඬ නැගීමේ මගක් ලෙසිනි.<br>C - විදේශ ගතවීමේ උපක්‍රමයක් ලෙසිනි.<br>D - රට තුළ දේව රාජ්‍ය ගොඩ නැගීමට වැයවීමේ සාධකයක් ලෙසිනි. |

ඉහත වගුව අනුව වඩා නිවැරදි වන්නේ
   (1) A (2) B (3) C (4) D

[ පස්වැනි පිටුව බලන්න.

30. ශ්‍රී ලාංකික දරුවන්ගේ අභිමානය සුරැකීමේ කිතුනු වගකීම වන්නේ
   (1) ළමා මෙහෙවර සේවයට විරුද්ධව හඬ නැගීමයි.
   (2) ජීවිත අභියෝගයන්ට මුහුණ දීමෙන් ඔවුන් වළක්වා ලීමයි.
   (3) අයහපත් මිතුරු මිතුරියන් ඈසුරෙන් ඔවුන් ඈත් කිරීමයි.
   (4) ළමා අතවර වළක්වා ගැනීම සඳහා ඔවුන් දැනුවත් කිරීමයි.

31. "බිය නොවන්න මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත." ඉහත අභියෝගයට මුහුණ පාන කිතුනුවා විශේෂයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග දක්වන කාණ්ඩය වන්නේ
   (1) එඩිතර භාවය ⟶ ස්වයං තීරණගැනීමේ හැකියාව ⟶ උදම් වීම
   (2) තිර විශ්වාසය ⟶ කීකරුකම ⟶ යහපත් ක්‍රියාකාරීත්වය
   (3) බුද්ධිමත් බව ⟶ කපටිකත්වය ⟶ උදම් වීම
   (4) නිහතමානීත්වය ⟶ කීකරුකම ⟶ පක්ෂපාතිත්වය

32. දේව රාජ්‍යයේ වටිනාකම් බෙද ගැනීම යනුවෙන් අදහස් කරන්නේ
   (1) ශ්‍රී ලාංකික සංදර්භයට ගැළපෙන කිතුනු ජීවිත ගත කිරීම ය.
   (2) නව තාක්ෂණික ක්‍රම උපරිමයෙන් යොදා ගැනීම ය.
   (3) මහා පරිමාණ ආත්ම ප්‍රබෝධතා රැස්වීම් සංවිධානය කිරීම ය.
   (4) සෑම ප්‍රදේශයකම දේව මැදුරු ඉදි කිරීම ය.

33. සත්‍යය පිටු දකින්නන් සිටින සමාජයක් මෙහෙයවන කිතුනුවා අවධාරණය කළ යුත්තේ
   (1) කුරුසිය අසල මුර සෙබලාගේ ප්‍රකාශනයන් ය.
   (2) කුරුසිය අසල ජනතා ප්‍රධානීන්ගේ ප්‍රකාශනයන් ය.
   (3) කුරුසිය අසල රෝම ශතාධිපතියාගේ ප්‍රකාශනයන් ය.
   (4) කුරුසිය අසල සොරුන් දෙදෙනාගේ ප්‍රකාශනයන් ය.

34. ශ්‍රී ලංකාවේ ස්ථිර සාමයක් සඳහා, කිතුනුවන්
   A - සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ඇදහිලි, භාෂා හා සම්ප්‍රදායයන්ට ගරු කළ යුතු ය.
   B - මිනිසා පරිසරය අනුව හැඩ ගැසීම බලාපොරොත්තු විය යුතු ය.
   C - පවුල් සබැඳියා යහපත් කිරීමට උත්සාහ ගත යුතු ය.
   D - දිළිඳුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිය යුතු ය.

   මින් වඩාත් නිවැරදි වන්නේ
   (1) A (2) B (3) C (4) D

35. "ඔබ සොරෙකු හා සටනට මෙන් කඩු මුගුරු රැගෙන ආවහු ද?" මෙම ප්‍රකාශනය කළේ
   (1) ජේසුස් වහන්සේ විසින් ජූදස්ට
   (2) ජේසුස් වහන්සේ විසින් නායක පූජකයන්ට හා මුර සෙබළුන්ට
   (3) ගෝලයින් විසින් ජූදස්ට
   (4) ගෝලයින් විසින් උත්තම පූජකයාගේ දසයින්ට

36. ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට පිවිසීම තුළ වූ විශිෂ්ඨත්වය සංකේතවත් වූයේ
   (1) සමූහයාගේ ප්‍රීති ඝෝෂාව මගිනි. (2) කොටළුවකු මත ගමන් කිරීම මගිනි.
   (3) පරිසිවරුන්ගේ ප්‍රතිචාර මගිනි. (4) ගෝලයින්ගේ සාම පැතුම මගිනි.

37. කිතුනුවා ක්‍රිස්තුස් වහන්සේ නමැති සැබෑ මිදිවැලට ඒකාබද්ධ විය යුත්තේ
   (1) සමෘද්ධිමත් ජීවිත ගත කරන පිණිස ය.
   (2) මුළු ලොවම ඒකත්වයට ඇතුළු කර ගන්නා පිණිස ය.
   (3) මුල් කිතුනුවන් මෙන් සියල්ල පොදුවේ තබා ගන්නා පිණිස ය.
   (4) ශ්‍රී ලාංකික සමාජ වටිනාකම් අගයන පිණිස ය.

38. හිංසනයට හා පීඩාවට පත් කරනු ලැබීමට විරුද්ධ වන කිතුනුවා
   A - මානව අයිතීන් තහවුරු කිරීමට පෙරමුණ ගත යුතු ය.
   B - පීඩකයන් හා හිංසකයන් හට අවිහිංසාවෙන් විරුද්ධ විය යුතු ය.
   C - හිංසනයට හා පීඩාවට පත් කරනු ලැබීමට හේතුන් විමසිය යුතු ය.
   D - නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්ට බලපෑම් කළ යුතු ය.

මින් වඩාත් නිවැරදි වන්නේ

(1) A, B (2) B, C (3) C, D (4) A, D

39. සමාවීම ගැන කිතුනු ආකල්පය දක්වන ප්‍රකාශය වන්නේ
   A - සමාව නිසා නැවත නැවත වැරදි කරන බැවින් වැරදි කරුවන්ට සමාව දීම නුසුදුසු ය.
   B - ඉර බසින තුරු කෝපය තබා නොගන්නා ලෙස පේදුරු තුමා පැවසී ය.
   C - සමාව දෙන්නාගේ කරුණාව ද සමාව ලබන්නාගේ පසුතැවිල්ල ද සමාව සඳහා වැදගත් ය.
   D - සමාව යැදීමේ කොන්දේසි පිට පමණක් සමාව පිදිය යුතු ය.

(1) A (2) B (3) C (4) D

40. ශුද්ධ සහභාගිකමේ පිළිවෙතට අද කිතුනුවන් සහභාගි විය යුත්තේ විශේෂයෙන් ම
   A - එය දේව රාජ්‍යයේ භෝජන සංග්‍රහය නමැති බලාපොරොත්තුවේ පූර්ව රස විඳීමක් බැවිනි.
   B - එය ජුදෙව් පාස්කු මංගල්‍යයේ පසුකාලීන අවස්ථාවක් බැවිනි.
   C - එය හුදෙක් ක්‍රිස්තු නියෝගයන් පිළිපැදීමක් වන බැවිනි.
   D - එය ක්‍රිස්තුස් වහන්සේ හා සහෝදර ජනතාව සමග සහභාගිත්වයට පිවිසීමක් බැවිනි.

(1) A, B වඩා නිවැරදි ය. (2) B, C වඩා නිවැරදි ය.
(3) C, D වඩා නිවැරදි ය. (4) A, D වඩා නිවැරදි ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

## ක්‍රිස්තියානි ධර්මය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුලුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. (i) ජේසුස් වහන්සේ ඉගැන්වීම සඳහා භාවිත කළ උපක්‍රම **දෙකක්** ද ඒවා සඳහා යොදගත් අවස්ථාවලට උදහරණය බැගින් ද ඉදිරිපත් කරන්න.

(ii) මුල් කිතුනු සභාව තුළ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ **හතරක්** ලියා දක්වන්න.

(iii) මිටියාවතේ දේශනයේ ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ මේ වදන් සම්පූර්ණ කරන්න.

ඔබේ සතුරන්ට . . . . . . . . . . . . . . . .

ඔබට වෛර කරන්නන්ට . . . . . . . . . . .

(iv) "ඔබත් ගොස් **එසේම කරන්න**" ජේසුස් වහන්සේ මේ වදන් පැවසුවේ කාහට ද? "එසේ කරන්න" යන අභියෝගය දුන්නේ කුමක් කිරීම සඳහා ද?

(v) "ඔබ සතු දේ විකුණා දන් දෙන්න. **නොදිරන පසුම්බියද, නොපිරිහෙන වස්තුද** ස්වර්ගයේ ඔබට සපයා ගන්න." මෙහි තද අකුරින් යෙදෙන වාක්‍යංශ දෙකින් ජේසුස් වහන්සේ අවධාරණය කරන්නේ කෙබඳු වස්තූන් ගැන ද?

(vi) ජේසුස් වහන්සේ සමග ඇතිකරගත් පෞද්ගලික සබඳතාවය නිසා පූර්ණ ජීවිත පරිවර්තනයකට සාක්ෂි දරණ බයිබලයේ සඳහන් පුද්ගලයන් **දෙදෙනෙක්** නම් කරන්න. එම පරිවර්තනයට තුඩුදුන් අවස්ථා **දෙක** ඉතා ලුහුඩින් ලියන්න.

(vii) "යහපත් එඬේරා" සංකල්පය පැරණි ගිවිසුමෙන් ඔබ්බට ගෙන යමින් ජේසුස් වහන්සේ තම ජීවිත ආදර්ශයෙන් එය පරිපූර්ණ කළේ කෙසේ ද?

(viii) "මෙහෙසුරු දිවැයිවරයා" ලෙස හඳුන්වනු ලැබුයේ කවුරුන් ද?

(ix) අද බෙදීම්වලට ලක්වී ඇති කිතුනු සභාවනට ජෙරුසලමේ මන්ත්‍රණ සභාවෙන් ගත හැකි මග පෙන්වීම් **දෙකක්** සඳහන් කරන්න.

(x) පහත සඳහන් සත්‍යයන් ගැබ්ව ඇති ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උපමා කථා සඳහන් කරන්න.

(අ) දේව බලය නිසා දේව රාජ්‍යයේ වර්ධනය පුදුමාකාර ලෙස සිදුවන බව.

(ආ) සමකාලීන සමාජයේ ඇති බාධක මධ්‍යයේ වුව ද දේව රාජ්‍යයේ වර්ධනය සිදුවන බව.

*(ලකුණු 2 × 10 = 20 යි)*

2. "මනුෂ්‍ය පුත්‍රයා සබත් දිනට පවා අධිපතියාණෝ ය."

(i) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කුමක් හේතු කොට ගෙන කාහට ද?

(ii) ඉහත සඳහන් ප්‍රකාශය සනාථ කරමින් මනුෂ්‍යයන් කෙරෙහි සානුකම්පිත දෘෂ්ටියකින් ජේසුස් වහන්සේ ක්‍රියා කළ අවස්ථාවක් ලුහුඬින් ඉදිරිපත් කරන්න.

(iii) ඔබ අසල්වැසියකුට හෝ ඉගෙනුම ලබන පාසලේ ශිෂ්‍යකුට/ශිෂ්‍යාවකට මනුෂ්‍යත්වය පෙරදැරි කර ගෙන ක්‍රියා කළ අවස්ථාවක් හා එසේ කළ අන්දම විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

[ අටවැනි පිටුව බලන්න.

3. "මැවිල්ල අවසානයේ දී මුළු විශ්වයම මනහර බව දෙවියන් වහන්සේ දුටු සේක." ලෙස බයිබලයේ සඳහන් වේ.
   (i) මනහර ලොව තුළ අද හටගෙන ඇති විවිධ ව්‍යසන කවරේ ද?
   (ii) ලෝකය පිළිබඳ මනා අවබෝධයක් ඇති මනුෂ්‍යයන් මෙම ව්‍යසන තත්ත්වයට වගකීම බාරගත යුත්තේ මන් ද?
   (iii) උද්ගතව ඇති මෙම තත්ත්වය යහපත් අතට හරවා ගැනීමෙහි ලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් වශයෙන් ඔබට දයක විය හැක්කේ කෙසේදැයි පහදන්න. (ලකුණු 10 යි)

4. (i) පිතෘ මූලික සමාජයක් වූ ජුද සමාජයේ ජේසුස් වහන්සේ කාන්තාවනට විමුක්තිය සැලසීමට පියවර ගත් අවස්ථා දෙකක් උදහරණ ලෙස ඉදිරිපත් කරන්න.
   (ii) එම අවස්ථා දෙකෙහි දී ජේසුස් වහන්සේ කෙබඳු සමාජ තහංචි අභිබවා ක්‍රියා කළේ දැයි පහදන්න.
   (iii) මාධ්‍ය මගින් ඔබට දැනගන්නට ලැබී ඇති කාන්තා අතවර ඉදිරිපත් කර ඒවා මගහැරවීමට ගත හැකි යෝජනා ලයිස්තු ගත කරන්න. (ලකුණු 10 යි)

5. "රට නැංවීම සඳහා පරිත්‍යාග කිරීමේ අවශ්‍යතාවය මාධ්‍ය මගින් නිරන්තරව ඉදිරිපත් කෙරේ."
   (i) ජේසුස් වහන්සේ පරිත්‍යාගශීලි දීමනාව අගය කළ අවස්ථාවන් සංක්ෂිප්ත ලෙස ලියන්න.
   (ii) අවතැන්වූවන් විශේෂයෙන් ළමයින්, මුහුණපාන ගැටළු කිහිපයක් ලැයිස්තු ගත කරන්න.
   (iii) "මම සාගිනිව සිටියෙමි. ඔබ මට කන්න දුන්නාහු ය. . . ආගන්තුකව සිටියෙමි. ඔබ මා පිළිගත්තාහුය. . . මේ සහෝදරයන්ගෙන් ඉතා සුළු තැනැත්තාට වුවද ඔබ එසේ කළා නම් එය කළේ මට ය." යන ජේසුස් වහන්සේගේ ප්‍රකාශය මත පිහිටා කිතුනු සංගම් මගින් එබඳු අය වෙනුවෙන් කළ හැකි දේ විස්තර කරන්න. (ලකුණු 10 යි)

6. පාසලේදී හෝ ඉදිරි අනාගතයේ දී මෙරට පුරවැසියන් වශයෙන් හෝ ඔබට වගකීම් භාර වනු ඇත.
   (i) එම වගකීම් ඉටු කිරීමේදී දේව රාජ්‍යයේ පුරවැසියෙක් වශයෙන් ඔබට ජේසුස් වහන්සේ පවරා ඇති භූමිකාව කුමක් ද?
   (ii) එම භූමිකාව සාර්ථක කර ගැනීමෙහි ලා කිතුනුවකු වශයෙන් අදළ කරගත හැකි අරමුණු කවරේ ද?
   (iii) යම් වගකීමක් පැවරුණු අවස්ථාවක ඔබ දේව රාජ්‍යයේ පුරවැසි අනන්‍යතාවය පදනම් කර ගෙන කෙසේ ක්‍රියා කරන්නේ දැයි විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. (i) ජේසුස් වහන්සේ ගේ කාලයේ දී ජුද සමාජයේ පැවති බෙදීම් නොතකා උන්වහන්සේ සාමකාමී සහජීවනය සඳහා ක්‍රියා කළ අවස්ථා දෙකක් ඉදිරිපත් කරන්න.
   (ii) වඩාත් පුළුල් සමාජයක් තුළ සාමකාමී සහජීවනය පිළිබඳ ජේසුස් වහන්සේගේ ප්‍රතිපත්ති පාවුළුතුමා ඉදිරියට ගෙන යාමට ක්‍රියා කළේ කෙසේ ද?
   (iii) වත්මන් ශ්‍රී ලංකා සමාජය තුළ පවතින බෙදීම් සඳහන් කර සාමකාමී සහජීවනය සඳහා කිතුනු අප ගත යුතු ප්‍රායෝගික ක්‍රියා මාර්ග විස්තර කරන්න. (ලකුණු 10 යි)

***